# ගුරුවරයාගේ ස්වභාවය අනුව ගොඩනැගෙන ශිෂ්‍ය ඉගෙනුම් ශෛලිය පිළිබඳ බෞද්ධ පර්යාවලෝකය

A Buddhist view on Student Learning Styles Based on the Nature of the Teachher

ඉඹුලමුරේ විමලරතන හිමි

## Abstract

The teacher and the student play key roles in the classroom learning-teaching process. Student learning takes place through teacher-student interaction. His or her learning style plays a significant role in the student's conceptual achievement. The learning style is based on the teacher's teaching as well as the school environment and subject content. The role of the teacher as a living person is unique. As a result, research is currently underway from various perspectives, examining the role of the teacher in shaping a student's learning style. Accordingly, the learning-teaching process is entering a new path. This study aims to discuss how the teacher should deal with the student's learning style according to the Theravada Tripitaka formula.

**Key word:** Teacher, Precepton, Learning Style.

**සාරසංක්ෂේපය**

පන්තිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී ගුරුවරයා හා ශිෂ්‍යයා ප්‍රධාන භූමිකාධාරීන් ලෙස ක්‍රියා කරති. ගුරු-සිසු අන්තර් ක්‍රියාකාරීත්වය ඔස්සේ සිසුවාගේ ඉගෙනුම සිදුවේ. සිසුවාගේ සංකල්ප සාධනය සඳහා ඔහුගේ හෝ ඇයගේ ඉගෙනුම් ශෛලිය සුවිශේෂී මෙහෙයක් ඉටු කරයි. ඉගෙනුම් ශෛලිය ගුරුවරයාගේ ඉගැන්වීම මෙන්ම පාසල් පරිසරය හා විෂය අන්තර්ගතය මත පදනම්ව සකස්වන්නකි. එහිදී සජීවී පුද්ගලයෙක් වශයෙන් ගුරුවරයාගේ

කාර්යභාරය අද්විතීය ය. මේ හේතුවෙන් සිසුවාගේ ඉගෙනුම් ශෛලිය සකස්වීම සඳහා ගුරුවයාගේ ක්‍රියාකාරීත්වය කවරාකාරද යන්න විමර්ශනය කරමින් විවිධ දෘෂ්ඨී කෝණයන්ගෙන් පර්යේෂණ මේ වන විට දියත් වෙමින් පවතී. ඒ අනුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය නව මාවතකට පිවිසෙමින් පවතී. මෙහිදී ථේරවාදී ත්‍රිපිටකාගත සූත්‍රානුසාරයෙන් ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලිය විෂයෙහි ගුරුවරයා කවරාකාරයෙන් ඉවහල් වන්නේදැයි සාකච්ඡා කිරීමට මෙම අධ්‍යයනයෙන් අපේක්ෂිතය.

**යතුරු පදඃ** ගුරුවරයා, උපාධ්‍යාය, ඉගෙනුම් ශෛලිය

**හැඳින්වීම**

ශිෂ්‍ය ඉගෙනුම් ශෛලිය පිළිබඳව සිදුකර ඇති පර්යේෂණ අනාවරණ අනුව ශිෂ්‍යය ඉගෙනුම් ශෛලිය සඳහා අභ්‍යන්තර හා බාහිර වශයෙන් ඉවහල්වන විවිධ සාධක දක්වා ඇත. ඒ අතර ගුරුවරයා බාහිර වශයෙන් පවතින සාධයකි. ථේරවාද මූලාශ්‍රයන්හි ගුරුවරයාගේ ක්‍රියාකාරීත්වය මත පදනම්ව සකස්වූ ශිෂ්‍ය ඉගෙනුම් ශෛලියක යම් යම් ලක්‍ෂණ විද්‍යමානය. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව ථේරවාදී මූලාශ්‍රයනන්හි නිරූපිත ගුරුවරයාගේ ක්‍රියාකාරීත්වය මත පදනම්ව සකස්වූ ශිෂ්‍ය ඉගෙනුම් ශෛලිය කවරාකාරද යන්නයි. පර්යේෂණ අරමුණු ලෙස ගුරුවරයා පිළිබඳ බෞද්ධ මූලාශ්‍රයාගත කරුණු අධ්‍යයනය කිරීම හා ශිෂ්‍ය ඉගෙනුම් ශෛලිය සකස්වීම සඳහා ඉවහල්වන ගුරුවරයාගේ ක්‍රියාකාරීත්වය බෞද්ධ දේශනා ආශ්‍රිතව අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනය විෂයමාලා සම්පාදකයින්ට මෙන්ම ප්‍රතිපත්ති සම්පාදයකයින්ට ස්වකීය කාර්ය පහසු කර ගැනීමට ඉවහල් වන අතර ගුරුවරුන්ට ස්වකීය ගුරු භූමිකාව වඩා කාර්යක්‍ෂම හා ඵලදායී ලෙස සකස් කර ගැනීමට ඉවහල් කරගත හැකිය. දෙමාපියන්ට ස්වකීය දරුවාගේ ඉගෙනුම් ශෛලියට ගැලපෙන ගුරුවරයා තෝරා ගැනීම සඳහත් ශිෂ්‍යයාට ස්වකීය ඉගෙනුම් ශෛලිය ගුරුවරයාගේ ස්වභාවය අනුව සකස් කර ගැනීමටත් ඉවහල් කරගත හැකිය.

**සාහිත්‍ය විමර්ශනය**

ශිෂ්‍යයා ඉගෙනගන්නා ආකාරය හා ගුරුවරයා උගන්වන ආකාරය පිළිබඳව අධ්‍යාපන මනෝවිද්‍යාඥයන් විසින් සිදුකරන ලද පර්යේෂණ ඔස්සේ ඉගෙනුම් ශෛලිය පිළිබඳ විවිධ නිර්වචන ඉදිරිපත්වී ඇත.තායිලන්තයේ වෛද්‍ය උපාධිය හදාරණ සිසුන්ගේ ඉගෙනුම් ශෛලිය හා ශිෂ්‍ය සාධනය පිළිබඳ විචුදා ඇතුලු පිරිස සිදුකරන ලද අධ්‍යයනයේදී ඉගෙනුම් ශෛලිය යනු ශිෂ්‍යයා විසින් තොරතුරු අවශෝෂණය කර ගැනීම, අවබෝධ කර ගැනීම, ක්‍රියාවට නැංවීම සහ රඳවා තබා ගැනීම ආශ්‍රිත පුද්ගල මනසේ ක්‍රියාකාරීත්වය අනුව ගොඩනැගෙන්නක් බව දක්වයි (Wichuda, Chaisiri at all,2015(02). එම පර්යේෂණයේ නිගමනයක් ලෙස විවිධ ඉගෙනුම් අන්තර්ගතයන් සහ ගුරුවරයගේ විවිධ ඉගැන්වීමේ ක්‍රම හේතුවෙන් ඉගෙනීමේ ශෛලීන් සහ ශිෂ්‍ය සාධනය අතර සම්බන්ධය පූර්ව සායනික හා සායනික සිසුන් අතර වෙනස් වන බව දක්වා ඇත. දුරස්ථ ඉගෙනුම් විෂයෙහි බලපාන ඉගෙනුම් ශෛලිය පිළිබඳ ජේම්ස් සහ ගාඩ්නර් සිදුකරන ලද අධ්‍යයනයේදී ඉගෙනුම් ශෛලිය යනු ඉගෙනගන්නන් තමන් ඉගෙනගන්නට උත්සාහකරන දේ වඩාත් ඵලදායී ලෙස වටහා ගැනීම, සැකසීම, ගබඩා කිරීම හා සිහිපත් කරන සංකීර්ණ ආකාරය සහ කැමැත්ත වශයෙන් අර්ථ දක්වති (James) Gardner,1995:19-20). රීඩ් විසින් ESL/EFL පන්තිකාමරයේ ඉගෙනුම් ශෛලිය පිළිබඳ සිදුකරන ලද අධ්‍යයනයේදී ඉගෙනුම් ශෛලිය යනු පුද්ගලයන්ගේ ස්වභාවික පුරුදු මඟින් නව තොරතුරු හා කුසලතා අවශෝෂණය කර ගැනීම, සැකසීම හා රඳවා තබා ගැනීම ලෙස දක්වයි (Reid,1995:32). ඇතැම් මනෝවිද්‍යාඥයෝ ඉගෙනුම් ශෛලීන් බුද්ධිමය ශෛලීන් ලෙස ද හඳුන්වති (Zhang, at all, 2013:225).

ඉගෙනුම් ශෛලි ආකෘති හා ඉගෙනුම් ශෛලිය පිළිබඳ පරීක්ෂණ සිදුකරන අධ්‍යාපන පර්යේෂකයෝ පුද්ගලයෙකුගේ ඉගෙනුම් ශෛලිය හඳුනා ගැනීමට සහ විධිමත් පන්ති කාමර කළමනාකරණයේදී අභිමත ඉගෙනුම් ක්‍රියාවලීන් පුරෝකථනය කිරීමට පුළුල් පරාසයක අනාවරණ ඉදිරිපත් කර ඇත (Bostrom 2012:13). එහිදී ඇතැම් ඉගෙනුම් ශෛලි ආකෘති පුද්ගලයාගේ ප්‍රජානන ශෛලිය අනුව තොරතුරු සකසන ආකාරය හඳුනා ගැනීමට උත්සාහ කරන අතර ඇතැම් ඉගෙනුම් ශෛලි ආකෘති ඉගෙනීමේදී ශරීරයේ ක්‍රියාකාරීත්වය

අවධාරණය කරයි ඇතැම් ඉගෙනුම් ශෛලී ආකෘති ඉගෙනීමේ ශෛලිය පුද්ගලයාගේ ස්ථාවර හා උරුම වූ ගතිලක්ෂණවලට අනුව සකස්වූවක් ලෙස දකවන අතර ඇතැම් ඉගෙනුම් ශෛලි ආකෘති ස්වයං අත්දැකීම් හා පුද්ගලයා අන්‍යයන් හා ඇතිකරගන්නාවූ ගතික අන්තර් ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස අර්ථකථනය කරයි. ගුරුවරයාගේ ස්වභාවය අනුව ගොඩනැගෙන ඉගෙනුම් ශෛලියේදී ශිෂ්‍යයා හා ගුරුවරයා අතර සිදුවන අන්තර්ක්‍රියාකරණයේදී ශිෂ්‍යයා තොරතුරු අවශෝෂණය කරගැනීම, අර්ථකථනය කිරීම, සැකසීම, අවබෝධ කර ගැනීම, සිහිපත් කිරීම ඇසුරින් ශිෂ්‍ය ඉගෙනුම් ශෛලිය සකස්වීම අධ්‍යයනය කරයි. මූලිකවම ඉගෙනුම් ශෛලිය හා ඉගැන්වීම් ශෛලිය යනු කුමක්දැයි අවබෝධකරගත යුතුය. ගෆූර් හා බාහු ඉගෙනුම් ශෛලියේ හා ඉගැන්වීම් ශෛලියේ ප්‍රධාන ලක්ෂණ වගු ගතකර ඇත. ඒ අනුව

| | ඉගෙනුම් ශෛලිය | ඉගැන්වීමේ ශෛලිය |
|---|---|---|
| 1 | ඉගෙනුම් ශෛලිය සිසුවා ඉගෙන ගන්නා ආකාරය සලකා බලයි | ඉගැන්වීමේ ශෛලිය ගුරු-වරයා උගන්වන ආකාරය සලකා බලයි. |
| 2 | ඉගෙනුම් ශෛලිය ඉගෙනුම්කරු ඉගෙනීම කළමනාකරණය කරන ආකාරය විස්තර කරයි | ඉගැන්වීමේ ශෛලිය, ගුරු-වරයාගේ උපදෙස් හා පන්ති කාමර පරිසරය කළමනාක-රණය කරන ආකාරය විස්තර කරයි. |
| 3 | ඉගෙනුම් ශෛලිය අභ්‍යන්තර සංජානන ක්‍රියාවලියකින් සමන්විත ය. | ඉගැන්වීමේ ශෛලියට පුද්ගල ඉගෙනුම් ක්‍රමය සහ සංජානන ශෛලිය බලපායි. |
| 4 | ඉගෙනුම් ශෛලිය යනු සමාන ඉගෙනුම් ක්‍රමෝපායන් අනුගමනය කිරීමේ සාමාන්‍ය ප්‍රවණතාවකි. | ඉගැන්වීමේ ශෛලිය යනු පන්ති කාමර හැසිරීම් හඳුනාගත හැකි සමූහයකි. |
| 5 | ඉගෙනීමේ ශෛලිය යනු එක් එක් පුද්ගලයා තොරතුරු රැස් කිරීම, සංවිධානය කිරීම සහ තොරතුරු ප්‍රයෝජනවත් දැනුම-ක් බවට පරිවර්තනය කිරීමයි. | ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී ගැටලු විසඳීමට, කාර්යයන් කිරීමට සහ තීරණ ගැනීමට වඩාත් කැමති ක්‍රමය ඉගැන්වීමේ ශෛලිය යි |

(GaFoor: Babu, 2012:58).

මේ අනුව ඉගෙනුම් ශෛලිය යනු ශිෂ්‍යයා තොරතුරු රැස් කිරීම, සංවිධානය කිරීම හා තොරතුරු අර්ථාන්විත දැනුමක් බවට පත්කිරීම ආශ්‍රිත ඉගෙනුම් ක්‍රමෝපායන් අනුගමනය කරමින් යමක් සංජානනය කරගැනීමෙන් ස්වකීය ඉගෙනුම කළමනාකරණය කිරීම යි. සංජානන ක්‍රියාවලිය සඳහා බලපාන බාහිර සාධකයක් ලෙස ගුරුවරයා හා ඔහුගේ ඉගැන්වීමේ ශෛලිය දැක්විය හැකිය. ඉගැන්වීමේ ශෛලිය යනු ගැටලු විසඳීමට, යම් කාර්යයන් කිරීමට සහ තීරණ ගැනීමට ගුරුවරයා උපදෙස් ලබාදීම හා පන්ති කාමර පරිසරය කළමනාකරණය කරන ආකාරය යි. මේ අනුව ඉගෙනුම් ශෛලිය ගුරු-සිසු අන්තර්ක්‍රියාකරණය ඔස්සේ ගොඩනැගෙන්නකි. මෙම අධ්‍යයනයේදී ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලිය සඳහා බලපාන ගුරු සාධකය පිළිබඳව ථේරවාද මූලාශ්‍රය ආශ්‍රයෙන් අධ්‍යයනය කිරීමට අපේක්ෂිතය.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුරුවරයාගේ ස්වභාවය අනුව ගොඩනැගෙන ශිෂ්‍ය ඉගෙනුම් ශෛලිය අධ්‍යයනය කරන මෙම අධ්‍යයනය ග්‍රන්ථාගත තොරතුරු අධ්‍යයනය කරමින් සිදු කිරිමට අපේක්ෂා කරන බැවින් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයේ පවතින සන්ධාර විශ්ලේෂණ පර්යේෂණ ක්‍රම ශිල්පය යොදා ගන්නා ලදි.

**සාකච්ඡාව**

ගුරුවරයා හා ශිෂ්‍ය ඉගෙනුම් ශෛලිය අතර අවියෝජනීය සම්බන්ධයක් පවතින බව පැහැදිලිය. ගුරුවරයාගේ ඉගැන්වීම් ශෛලිය අනුව ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලිය ද ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලිය අනුව ගුරුවරයාගේ ඉගැන්වීම් ශෛලිය ද සකස්වේ. ඇතැම් අවස්ථාවක ගුරුවරයාගේ කාර්ය ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලිය හා නොගැලපීම සිසුවා ඉගෙනීමෙන් ඉවත් වීමට හෝ ඇතැම්විට අලුත් ඉගෙනුම් ශෛලියක සැකසීම පිණිස ද හේතුවිය හැකිය. මෙසේ සිදුවන ගුරු-සිසු අන්තර්ක්‍රියාකරණය සිසුවාගේ ඉගෙනුම් ශෛලිය නිර්මාණය කරයි. ගුරුවරයා ලියන ආකාරයෙන්ම අකුරු ලිවීම, ගුරුවරයා ශබ්ධ උච්චාරණය කරන අයුරින් ශබ්ද උච්චාරණය කිරීම, ගුරුවරයා කතාකරන ස්වරූපයෙන්ම කතා කිරීම, ගුරුවරයා ධර්ම

දේශනා හා පිරිත් දේශනා කරන ස්වරූපයෙන් ධර්ම දේශනා හා පිරිත් දේශනා කිරීම, ගුරුවරයා සිවුර හඳින පොරවන අයුරින් සිවුරු හැඳීම පෙරවීම ආදිය ගුරු සිසු අන්තර්ක්‍රියාකරණයෙන් සිසුවාගේ ඉගෙනුම් ශෛලිය සකස්වීමට නිදසුන්ය. ඒ අනුව ඉගෙනුම් ශෛලිය සඳහා බලපාන බාහිර සාධක අතර ප්‍රධාන සාධකයක් වන ගුරුවරයාගේ ක්‍රියාකාරීත්වය පිළිබඳව බෞද්ධ දේශනාවන්හි පැහැදිලි කර ඇත. ගුරුවරයා හැඳින්වීම සඳහා ආචරිය හා උපාධ්‍යාය යන පද බුදුසමයෙහි ව්‍යවහාර කරයි.

## ආචරිය

පාළි භාෂාවේ 'ආචරිය' ලෙස ගුරුවරයා යන වචනය දක්වා ඇත (පාළි අකාරාදිය,2014:96). 'ගුරුවර' යන වචනය ගුණසේන සිංහල ශබ්දකෝෂය උගන්වනවා, ආචාර්යයා මව හෝ පියා ලෙස දක්වයි (ගුණසේකර සිංහල ශබ්දකෝෂය,2011:689). ආචාරිය හා ආචරිය යන වචන ගුරුවරයා යන්නට පර්යාය ලෙස සිංහල භාෂාවේ ද උපයුක්ත කරගනු ලබයි. ආචරිය යන්න සඳහා බෞද්ධ ශබ්දකෝෂයේ ආචාර්යවරයා, ගුරුවරයා, පැවිද්දන් විනයෙහි හික්මවන ආචාර්යවරයා ලෙස දක්වා ඇත (බෞද්ධ ශබ්දකෝෂය1,2010:238). ආචාරි යන පදය ශිල්ප ශාස්ත්‍ර උගන්වන තැනැත්තා, පැවිද්දන් ආචාර ශික්ෂාවෙහි හික්මවන්නා ලෙස දක්වා ඇත (ගුණසේකර සිංහල ශබ්දකෝෂය,2011:212). මේ අනුව ආචරිය යන්න ගුරුවරයා සඳහාත් ආචාරී යන පදය රත්‍රන්, රිදී ආදී භාණ්ඩ සකස් කරන ශිල්පීය හැකියාවක් සහිත ශිල්ප ශ්‍රේණියක පුද්ගලයෙකු හැඳින්වීමටත් යොදාගෙන ඇති බව පැහැදිලිය. ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, 'ආචාර්ය' ලෙස 'ශාස්ත්‍රාග මාදිය උගන්වන්නා' දක්වයි (ශ්‍රී සුමංගල ශබ්දකෝෂය,1952:117). මේ අනුව ආචාර්යවරයා යනු දැනුම, කුසලතා හා ආකල්පවලින් සිසුන් විනයෙහි හික්මවන්නාවූ පුද්ගලයා ලෙස අර්ථ නිරූපණය කිරීම යෝග්‍ය ය.

## උපාධ්‍යාය

ආචාර්යවරයා හා සමාන තවත් තනතුරක් විනය පිටකයේ සඳහන්ය. එනම් උපාධ්‍යාය තනතුරයි. ''ආචාර්යවරයා බැහැර ගිය කල්හි ද සිවුරු හැර ගිය කල්හි ද කලුරිය කළ කල්හි ද අන්‍යතීර්ථක

පක්ෂයකට මාරු වූ කල්හි ද ආචාර්යවරයෙකු නොමැති වූයේ අවවාද නොලබයි. අනුශාසනා නොලබයි. මේ හේතුවෙන් භික්ෂූන් විධිමත් ලෙස සිවුරු නො අඳිමින් නොපෙරවමින් නුසුදුසු ආචාර සමාචාර පවත්වමින් කටයුතු කරයි'' (බු.ජ.ත්‍රි.පි.ග්‍ර.මා. වි.පි. මහාවග්ග පාළි, මහාඛන්ධකයඃ131 https://tipitaka.lk/vp-mv-1/64-5/sinh). මේ හේතුවෙන් ආචාර්යවරයා හා සමාන තනතුරක අවශ්‍යතාවය පැනනැගුණි. ඒ අනුව බුදුන්වහන්සේ විසින් උපාධ්‍යාය තනතුර අනුදැන වදාරණ ලදි.

උපාධ්‍යාය වචනය පැවිදි කිරීමේ හා උපසම්පදාව ලබාදීමේ කටයුතුවල මූලිකව ක්‍රියාකරන හා වරද නිවරද පෙන්වා අවවාද දෙන ගුරුවරයා ලෙසත්, ධර්ම විනය උගන්වන්නා ලෙසත් සිංහල ශබ්දකෝෂයේ දක්වා ඇත (ගුණසේකර සිංහල ශබ්දකෝෂය,2011ඃ342). බෞද්ධ ශබ්දකෝෂයේ උපාධ්‍යාය යන්න උපදෙස් දෙන තැනැත්තා, මග නොමග පෙන්වා දෙන්නා, ධර්ම විනය පැහැදිලි කර දෙන්නා, සාමණේර භික්ෂූන්ට අවවාද අනුශාසනා කරන ගුරුවරයා, උපසම්පදා කර්මය හෝ පැවිදි කරවන භික්ෂූන් වහන්සේ වශයෙන් අර්ථ දක්වා ඇත (බෞද්ධ ශබ්දකෝෂය1,2010ඃ333). ශ්‍රී සුමංගල ශබ්දකෝෂයෙහි උපාධ්‍යාය ලෙස වරද නිවරද දක්වා අවවාද කරන්නා, ධර්මාදිය උගන්වන්නා ලෙස දක්වා ඇත (ශ්‍රී සුමංගල ශබ්දකෝෂය,1952ඃ174). මේ අනුව උපාධ්‍යායවරයා ආචාර්යවරයාට වඩා ආධ්‍යාත්මිකව සිසුවාට සමීපවූ ගුරුවරයා ලෙස දැක්විය හැකිය.

හින්දු ආගමික ග්‍රන්ථයත් වන මනුස්මෘතියෙහි ආචාර්යවරයා, උපාධ්‍යාය හා ගුරු යනුවෙන් පුද්ගලයන් තිදෙනෙක් හමුවේ (සෙනෙවිරත්න,2001ඃ46). හින්දු ආගමට අනුව යම් පුද්ගලයෙක් ශිෂ්‍යයෙකු උපනයන කොට ඔහුට කල්ප සහ රහස්‍ය උගන්වයි නම් ඔහු ආචාර්යවරයා යි. ප්‍රතිසන්ධියේ සිට වයස අවුරුදු අටකින් බ්‍රාහ්මණයාගේ ද වයස අවුරුදු එකොළහකින් ක්ෂත්‍රියයාගේ ද වයස අවුරුදු දොළහකින් වෛශ්‍යයාගේ ද උපනයන කර්මය සිදු කරයි. උපනයන කර්මය ආචාර්යවරයා විසින් පමණක් සිදු කරයි. උපාධ්‍යාය යනු වෘත්තිමය වශයෙන් වේදය හෝ වේදාංගයන්ගෙන් එක් කොටසක් පමණක් උගන්වන්නා ය. වේදයෙහි සඳහන් අයුරින් යමෙකු පිළිබඳ ගර්භධානාදි සංස්කාර කර ඔහු ආහාරාදියෙන් ඇති දැඩි කරන්නා ගුරු

ලෙස දැක්වේ. නමුත් මෙබඳු තනතුරු ත්‍රිත්වයක් බුදුසමයේ නොමැති අතර ආචාර්ය හා උපාධ්‍යාය තනතුරු දෙකෙන් එ සියලු කටයුතු ආවරණය කරයි.

බුදු දහමේ සඳහන් උපාධ්‍යායවරයා ශිෂ්‍යයාගේ කුඩු මහත් වැරදි බලා කරුණාවෙන් අවවාද ලබාදෙයි 'වජ්ජාවජ්ජං උපනිජ්ඣායතීති උපජ්ඣායො' (සුමනසිරි හිමි,1967:129). ශාසන බ්‍රහ්මචර්යාවේදී දිවි හිමි කොට ඇසුරු කළ යුතු තැනැත්තා ආචාර්යවරයා නම් වේ 'ආපාණකොටිං චරිතබ්බො ආචරියො' (සුමනසිරි හිමි,1967:128). ප්‍රව්‍රජ්‍යාචාර්ය, උපාධ්‍යාචාර්ය, නිශ්‍රයාචාර්ය, ධර්මාචාර්ය, හා කර්මාචාර්ය වශයෙන් ආචාර්යයන් වහන්සේලා පස්දෙනෙක් ශිෂ්‍යයා විසින් ඇසුරු කළ යුතු ය (චන්දවිමල හිමි,2008:211). ප්‍රව්‍රජ්‍යාචාර්ය යනු පැවිද්ද කරවන ආචාර්යවරයා යි. උපාධ්‍යාචාර්ය යනු නවකයන් ධර්ම විනයෙහි හික්මවන සාමණේරයන්හට ප්‍රධානවූ ආචාර්යවරයා යි. නිශ්‍රයාචාර්ය යනු නිස්සය කර්මය සිදුකරන නිස සමාදන්කරවන ආචාර්යවරයා යි. ධර්මාචාර්ය යනු ධර්ම-විනය ගැන දැනුම ලබාදෙන තැනැත්තා හෙවත් ත්‍රිපිටකය කියාදෙන ආචාර්යවරයා යි. කර්මාචාර්ය යනු උපසම්පදා විනය කර්මයකදී කර්ම වාක්‍ය කියන ආචාර්ය තෙරුන්වහන්සේ ය. මෙම පඤ්චවිධවූ ආචාර්යවරුන්ගේ කාර්ය භාරය හා උපජ්ඣායවරයාගේ කාර්ය භාරය සංසන්ධනය කිරීමේදී වඩා ආධ්‍යාත්මික ගැඹුරු බවක් උපාධ්‍යායවරයාගේ කාර්යභාරයේ පවතී. ආචාර්ය යන වචනය අධ්‍යාපනය ලබන අවස්ථාවට පමණක් සීමා වූ ගුරුවරයා අර්ථවත් වන අතර උපජ්ඣාය යන වචනය ගුරුවරයා හා ශිෂ්‍යයා අතර ජීවිත කාලය පුරාවටම පවතින ආධ්‍යාත්මික සම්බන්ධය අර්ථවත් කරයි. ඒ අනුව උපාධ්‍යායවරයා පැවිදි ශිෂ්‍යයාගේ ආධ්‍යාත්මික ගුරුවරයා ලෙස දැක්විය හැකිය (ඤාණිස්සර හිමි,2017:59).

### සද්ධිවිහාරික හා අන්තේවාසික

ගුරුවරයා හැඳින්වීම සඳහා උපයුක්ත උපාධ්‍යාය හා ආචාර්ය යන වචන හා එක්ව යෙදෙන සහසම්බන්ධතාවයෙන් යුක්ත තවත් වචන දෙකකි. එනම් සද්ධිවිහාරික හා අන්තේවාසික යන වචනයි. උපාධ්‍යාය යන වචන සමග සද්ධිවිහාරික යන වචනය ද ආචාර්යවරයා සමග අන්තේවාසික යන වචනය ද යෙදෙයි. සද්ධිවිහාරික යනු

උපාධ්‍යායන් වහන්සේ සමග එකට වාසය කරන භික්ෂුව යි. අන්තේවාසික යනු ගුරුවරයෙකු වෙත වාසය කරන ගිහි හෝ පැවිදි සිසුවා යි (බෞද්ධ ශබ්දකෝෂය1,2010:112) ආචාර්ය උපාධ්‍යාය යන තනතුරු හා සමව යන සද්ධිවිහාරික හා අන්තේවාසික යන තනතුරු අනුව ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලිය සකස්වීම විෂයෙහි ගුරු සාධකය අත්‍යාවශ්‍ය සාධකයක් වන බව පැහැදිලිය.

ආචාර්ය හා උපාධ්‍යාය තනතුරුවලින් මුල්කාලීනව ආචාර්යවරයා අනුදැන වදාළ අතර පසුව උපාධ්‍යායවරයා අනුදැන වදාරා ඇත. පැවිදි  පිරිසේ නොමනා හැසිරීම් ආචාර්ය හා උපාධ්‍යාය හිමිවරු පත්කිරීමට හේතු විය. ආචාර්යවරයා උපැවැදිවීම, කලුරිය කිරීම, ගරුකාපත්තියකට පත්වීම හේතුවෙන් මග නොමග කියාදීමට නිසි පුද්ගලයෙකු නොවීමෙන් සිසුවා කළයුත්ත නොකළයුත්ත හඳුනාගත නොහැකිවූවෙක් මංමුලාවූවෙකු විය. මේ හේතුවෙන් ශාසන බ්‍රහ්මචර්යාවේ ශික්ෂණය උදෙසා ආචාර්යවරයා හා සමාන සිසුවාගේ ආරක්ෂාව හා වගකීම දරන්නාවූ භික්ෂුවක් අවශ්‍යය විය. ඒ අනුව උපාධ්‍යාය තනතුර හා එම තනතුර සම්බන්ධ ඇවතුම් පැවතුම් හඳුන්වා දුණි. ආචාරයවරයා හා උපාධ්‍යායවරයා යන තනතුරු ශිෂ්‍යයාගේ මනා ශික්ෂණයට ඉවහල් විය. එම තනතුරු මත පදනම්ව ශිෂ්‍ය ඉගෙනුම් ශෛලිය සකස් විය. උපාධ්‍යායවරයා ශිෂ්‍යයා සමග කටයුතු කළ යුතු ආකාරය මහාවග්ගපාළියෙහි විස්තර කරයි. ඒ අනුව

''උපජ්ඣායෙන භික්ඛවෙ, සද්ධිවිහාරිකම්හි සම්මා වත්තිතබ්බං. තත්‍රායං සම්මාවත්තනා "උපජ්ඣායෙන භික්ඛවෙ සද්ධිවිහාරිකො සඞ්ගහෙතබ්බො අනුග්ගහෙතබ්බො උද්දෙසෙන පරිපුච්ඡාය ඔවාදෙන අනුසාසනියා.'' (බු.ජ.ත්‍රි.පි.ග්‍ර.මා. වි.පි. මහාවග්ග පාළිඃ 106).

උපාධ්‍යායවරයා සද්ධිවිහාරිකයාට සංග්‍රහ කිරීමෙන් හා අනුග්‍රහ ලබාදීමෙන් කටයුතු කළ යුතුය. මනාව පැවතීමේදී ඔහු විසින් ඉටුකළ යුතු කාර්යයන් කිහිපයකි. එනම් උදෙසීම, විචාරීම, අවවාද කිරීම හා අනුශාසනා කිරීමයි. එය අටුවාව මෙසේ පැහැදිලි කරයි.

''එහි උද්දෙස නම් පෙළ කියවීම ය. පරිපුච්ඡා නම් පෙළෙහි අරුත් වැනීමය. ඔවාද නම්, වස්තුව බටකල්හි, තවද බටකල්හි හෝ

නොබටකල්හි හෝ පළමු කොට කීම අවවාද නම්, නැවත නැවත කීම අනුශාසනී නම්''(සමන්තපාසාදිකා විනයට්ඨකථා-සිංහල පරිවර්තනය,2005:27). ඒ අනුව

උද්දෙසෙන - පෙන්වාදීම, දැක්වීම, පෙළ කියවීම

පරිපුච්ඡාය - ප්‍රශ්න ඇසීම, කරුණු විමසීම, පෙළෙහි අරුත් වැනීම

ඔවාදෙන - අවවාදය, කටයුතු නොකටයුතු තේරුම්කර දීම, පළමු කොට කීම

අනුසාසනියා - උපදේශය, යහපත අයහපත කියා දීම, නැවත නැවත කීම

වශයෙන් දැකිවිය හැකිය. ගුරුවරයා යම් කරුණක් ඉගැන්වීමේදී ඒ සංකල්පය පිළිබඳව මූලිකව පෙන්වා දීමක් හෝ දැක්වීමක් සිදු කරයි. නොඑසේනම් පෙළ කියවීමට ලබාදෙයි. එය උද්දේසනයයි. යම් කරුණක් පෙන්වාදීමෙන් එම සංකල්පය පඤ්චේන්ද්‍රිය ආශ්‍රයෙන් ග්‍රහණය කරගැනීමට සළස්වයි. අනතුරුව එම සංකල්පය නිවැරදිව ග්‍රහණය කළේදැයි විමසීමට සිසුන්ගෙන් කරුණු විමසීම සිදු කරයි. අරුත් පැහැදිලි කර දෙයි. එය පරිපුච්ඡාවයි. ඉන්පසු එම සංකල්පය වැරදි ලෙස ග්‍රහණය කර ඇත්නම් හෝ ගැටලු සහිතව ග්‍රහණය කර ඇත්නම් එය නිවැරදි කිරීමට හෝ තහවුරු කිරීමට ගුරුවරයා අවවාද හෙවත් කටයුතු නොකටයුතු දේ තේරුම් කරදීම සිදුකරයි. ඒ ඔස්සේ සිසුවාගේ අවබෝධය තවතවත් පහසු කරයි. එක්වරක් පමණක් යහපත අයහපත කියාදීම අවවාදය නම් වේ. එක් අවස්ථාවකින් සංකල්ප සාධනය නොවූයේ නම් නැවත නැවත පැහැදිලි කළ යුතුය. එක් වරකට වඩා අවවාද කිරීම අනුශාසනා කිරීම නම් වේ. මේ අනුව සිසුවා විෂය කරුණු ග්‍රහණය කරගන්නා ආකාරය, වටහාගන්නා ආකාරය. සකසාගන්නා ආකාරය හා සිහිපත් කරන ආකාරය අනුව ශිෂ්‍ය ඉගෙනුම් ශෛලිය සකස්වේ. ඒ සඳහා ඉවහල්වන බාහිර සාධකයක් ලෙස ගුරුවරයාගේ ඇනුම, ආකල්ප හා කුසලතා මත සකස්වූ ගුරුවරයාගේ ඉගැන්වීමේ ක්‍රමය දැක්විය හැකිය. ඒ ඒ ගුරුවරයාගේ දක්ෂතාවය අනුව ශිෂ්‍යයා ඉගෙනගැනීමට

උත්සාහ කරන දේ ඵලදායී ලෙස වටහා ගැනීම, ග්‍රහණය කරගැනීම හා සිහිපත් කරන ආකාරය සිදුකරයි.

බුදු සමයට අනුව ගුරුවරයාගේ මූලික කාර්යය සිසුවා අවබෝධය සඳහා මෙහෙයවීම යි. ඒ අනුව සිසුවා ආධ්‍යාත්මික හා කායික සංවර්ධනයක් ඇතිකරගනු ලබයි. මග පෙන්වීම පමණක් ගුරුවරයාගේ කාර්ය වන අතර එහි ගමන් කිරීම හෝ නොකිරීම සිසුවාගේ කාර්යයකි. බුදුන් වහන්සේ ද අවබෝධය සඳහා මග පෙන්වූ ශ්‍රේෂ්ඨ ගුරුවරයෙකි 'තුම්හෙහි කිච්චං ආතප්පං අක්ඛාතාරො තථාගතො' (බු.ජ.ත්‍රි.පි.ග්‍ර.මා. ධම්මපද පාළි, මග්ගවග්ගඃ 94). බුදුන් වහන්සේට සත්ත්වයන් දුකින් එතෙර කරවිය නොහැකි ය. නමුත් එතෙරවීම සඳහා අවශ්‍ය මග පෙන්වීම පමණක් සිදුකළ හැකි ය. මෙම මග පෙන්වීමේ ක්‍රියාවලියේදී ගුරුවරයාගේ ස්වභාවය අනුව ශිෂ්‍යයාගේ ගමන් මග තීරණය වෙයි.

මහාවග්ග පාළියට අනුව උපසම්පදාව ලබන ශිෂ්‍යයාගේ ස්වභාවය අනුව ගුරුවරයාගේ ඇසුර දිවි ඇතිතෙක් හෝ අවම වශයෙන් උපසම්පදාවෙන් වස් පහක් හෝ පවත්වා ගතයුතු ය. "අනුජානාමි භික්ඛවෙ, බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන පඤ්ච වස්සානි නිස්සාය වත්ථුං. අබ්‍යත්තෙන යාවජීවං" (බු.ජ.ත්‍රි.පි.ග්‍ර.මා.මහාවග්ග පාළිඃ196). ප්‍රතිබල සම්පන්නවූ ව්‍යක්ත භික්ෂූන් වහන්සේ විසින් පස්වසක් (උපාධ්‍යායවරයා හෝ ආචාර්යවරයා) ඇසුරු කොට විසිය යුතු අතර අව්‍යක්ත භික්ෂූහු විසින් දිවි තිබෙන තුරු (උපාධ්‍යායවරයා හෝ ආචාර්යවරයා) ඇසුරෙහි වාසය කළ යුතුය. ඒ අනුව ගුරුවරයාගේ මග පෙන්වීම මත ස්වාධීන ඉගෙනුම් ශෛලියක් සකසා ගැනීමට නොහැකි ශිෂ්‍යයා දිවි ඇතිතුරා ගුරුවරයා සමීපයෙහි වෙසෙමින් ගුරුවරයා අනුකරණය කරමින් සිය ඉගෙනුම් ශෛලිය සකස්කරගත යුතුය. මේ අනුව ශිෂ්‍යයාගේ ස්වභාවය අනුව ඔහුගේ ඉගෙනුම් ශෛලිය සකස්වීම උදෙසා ගුරුවරයාගේ මැදිහත්වීම කවරාකාරයෙන් සිදුවිය යුතුදැයි පැහැදිලිය.

ආචාර්යවරයෙකු වීම සඳහා සංවර්ධනය කරගත යුතු සුදුසුකම් කිහිපයක් මහාවග්ග පාළියෙහි සඳහන්ය. ඒ අනුව ගුරුවරයෙකු ලෙස ශිෂ්‍යයෙකු උපසම්පදා කිරීමට අපේක්ෂාකරන භික්ෂුව උපසම්පදාව

ලබා දස වර්ෂයක් හෝ ඊට වඩා වර්ෂ ප්‍රමාණයක් සම්පූර්ණ කළ යුතුය.

''අනුජානාමි භික්ඛවෙ බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන දසවස්සෙන වා අතිරෙක දසවස්සෙන වා උපසම්පාදෙතු'න්ති.'' (බු.ජ.ත්‍රි.පි.ග්‍ර.මා. වි.පි. මහාවග්ග පාළි, මහාඛන්ධකයඃ130,).

උපසම්පදාවෙන් වර්ෂ දහයක් හෝ වැඩි ප්‍රමාණයක් ශාසන බ්‍රහ්මචර්යාවේ හැසිරීම මෙන්ම ව්‍යක්ත හා ප්‍රතිබල වීම ද ආචාර්යවරයෙකු බවට පත්වීමට අත්‍යාවශ්‍ය සුදුසුකම් ය. ව්‍යක්ත යනු උගත් හා ප්‍රාඥ පුද්ගලයා හැඳින්වීමට යොදන විශේෂණ පදයකි. ප්‍රතිබල යනු සමර්ථ, ශූර, ශක්තිමත් යන අර්ථයෙන් සිංහල ශබ්ද කෝෂයේ දක්වා ඇත (ගුණසේකර සිංහල ශබ්දකෝෂය,2011ඃ1175). ඒ අනුව ශිෂ්‍යයෙකු උපසම්පදා කරන ගුරුවරයා ධර්ම-විනය පිළිබඳ මනා අවබෝධයකින් යුතු අවවාද අනුශාසනා කිරීමට යෝග්‍ය ප්‍රාඥයෙකු විය යුතු ය. ඔහු ධර්ම-විනය ස්වකීය ජීවිතයෙන් පිළිපැදීමේ හැකියාව සහිත ස්වකීය ඉඳුරන් හා හැඟීම් ශික්ෂණය කරගැනීමේ ශූරයෙකු විය යුතුය. මේ අනුව ගුරුවරයා දැනුම (විජ්ජා), ආකල්ප (චරණ) හා කුසලතාවලින් (කොසල්ල) යුක්තවූයේ පළමුව තමා ප්‍රඥාවන්තයෙකු වී තිදොර සංවර කිරීමේ දක්ෂයෙකුවී උගත් දෙය ක්‍රියාවෙන් පෙනුම් කිරීමේ ශූරයෙකු විය යුතුය. එවිට ගුරුවරයාගේ ස්වභාවය අනුව ශිෂ්‍යයා විසින් ස්වකීය ඉගෙනුම් ශෛලිය සකස්කර ගනු ඇත.

ගුරුපෞරුෂය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුව මූලිකවම ගුරුවරයා විෂය දැනුම, ගුණ ධර්ම හා ශිල්පීය හැකියාවලින් පරිපූර්ණ වී ස්වකීය පෞරුෂය ඒ අනුව ගොඩනගා ගනිමින් ආදර්ශය ඔස්සේ සිසුන්ට ඉගැන්වීම හා ශික්ෂණය කිරීම සිදුකළ යුතු ය. මේ අනුව ගුරුවරයා ශාසන බ්‍රහ්මචර්යාව පිළිබඳ මනා දැනුමක් ලබාගනිමින් ඒ ඔස්සේ හික්මෙමින් ශිෂ්‍යයාගේ හික්මීම සිදු කරයි. ගුරුවරයා මනා ශික්ෂණයකින් තොරවූයේ එකී ශික්ෂණය ශිෂ්‍යයාගෙන් බලාපොරොත්තු වීම නොකළ යුත්තකි. ශිෂ්‍යයා විසින් විමසනු ලබන ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු දීමේ හැකියාව, ගැටලු විසඳීමේ හැකියාව ගුරුවරයාට පැවතිය යුතුය. වසර දහයක් හෝ එයට අධික වසර සංඛ්‍යාවක් උපසපන් භික්ෂුවක ලෙස ශික්ෂණය ලැබීමෙන් ද

ගුරු ඇසුරෙහි සිටිමින් සූත්‍ර-විනය අධ්‍යයනය කිරීමෙන් ද ව්‍යක්ත හා ප්‍රතිබලතාවය සංවර්ධනය කරගත හැකිය. මේ අනුව බුදු දහමට අනුව ගුරුවරයා යනු ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලිය සකස්වීමෙහි පරමාදර්ශී චරිතයක් බව පැහැදිලිය.

ව්‍යක්ත හා ප්‍රතිබල ගුරුවරයාගේ ස්වභාවය විශුද්ධි මාර්ග යේ කර්මස්ථාන දායකයා පැහැදිලි කිරීමේදී දක්වා ඇත. කර්මස්ථාන දායකයා යනු ඒ ඒ ශිෂ්‍යයාගේ ස්වභාවය අනුව ස්වකීය භාවනාව සාර්ථක කර ගැනීම විෂයෙහි ගුරුහරුකම් ලබාදෙන ගුරුවරයා යි.

'' එබැවින් උන්වහන්සේ ධ්‍රියමාන කල්හි උන්වහන්සේ වෙතින් ගත් කර්මස්ථානයම සුගෘහිත වන්නේ ය. උන්වහන්සේ පිරිනිවි කල්හි අසූමහ සව්වන් අතුරෙන් යම් කෙනෙකුන් වහන්සේගෙන් ගන්නට වටනේ ය. ඔවුන් වහන්සේ පිරිනිවි කල්හි තමා යම් කමටහනක් ගනු කැමැති නම් ඒ කමටහන මැ ගෙනැ චතුෂ්ක-පඤ්චක ධ්‍යාන උපදවා ඒ ධ්‍යාන පදස්ථාන කොටැ විදශර්ශනා වඩා රහත් වූ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ වෙතින් ගත යුතු........ ඉදින් නො ලද නම් අනාගාමීන් වෙතින් ද ඔවුන් නො ලද නම් සකෘදාගාමි, වෙතින් ද, පිළිවෙළින් ගත යුතුය. ඒකපිටක ධරයකුදු නැති කල්හි අටුවා සමග එක සඟියක් ධරන ලජ්ජික විසින් ගත යුතු යි......'' (සිංහල විශුද්ධිමාර්ගය,1957:154).

මෙසේ ව්‍යක්ත හා ප්‍රතිබල සහිත ගුරුවරයා ගුණ ධර්ම හා ප්‍රඥාවෙන් උසස් තත්වයක සිටින අතර ඔහු ශිෂ්‍යයාගේ කළ්‍යාණ මිත්‍රයෙකි. මේ අනුව ගුරුවරයා සිසුවාට ආධ්‍යාත්මික සාධනයෙහි යම් ගැටලු ඇතිවූයේ නම් ඒවා විසඳමින් ශාසන බ්‍රහ්මචර්යාවේ යම් උකටලී බවක් ඇතිවුවහොත් එය මගහරවා ගැනීම සඳහා අවවාද අනුශාසනා කිරීමට යෝග්‍ය දැනුමක් හා ආයති සංවරයකින් යුක්ත ආධ්‍යාත්මික ගුණ ධර්මවලින් උසස් තත්වයක පවතින්නෙකු විය යුතුය. ගුරුවරයාගේ දැනුම, ආයති සංවරය හා ආධ්‍යාත්මික ගුණ ධර්මවල උසස් පහත් බව අනුව සිසුවාගේ ද දැනුම, ආයති සංවරය හා ආධ්‍යාත්මික ගුණ ධර්මවල උස්-පහත් බව තීරණය වේ. එමෙන්ම ගුරුවරයා විසින් සංවර්ධනය කරගත යුතු පඤ්චවිධවූ බලයක් සූත්‍ර කිහිපයකම දක්වා අත.

''පඤ්චිමානි භික්ඛවෙ බලානි. කතමානි පඤ්චඃ සද්ධාබලං, විරියබලං, සතිබලං, සමාධිබලං. පඤ්ඤාබලං. ඉමානි ඛො භික්ඛවෙ පඤ්චබලානි.'' (බු.ජ.ත්‍රි.පි.ග්‍ර.මා. අං.නි. පඤ්චක නිපාත, බලඅග්ග සූත්‍රය, බලදට්ඨබ්බ සූත්‍රය, බලවිතක්ඛ සූත්‍රය, බලසංඛාත්ත සූත්‍රය, සේඛබල අග්ග සූත්‍රය, තථාගතබල සූත්‍රයඃ 16-20). ඒ අනුව

1. ශ්‍රද්ධා බලය,
2. වීර්ය බලය,
3. ස්මෘති බලය,
4. සමාධි බලය,
5. ප්‍රඥා බලය

වශයෙන් එම බල පහ පෙළගැස්විය හැකිය. බුදුන් වහන්සේ සතුව ද මෙකී බල පඤ්චකය පැවතුණි. සෑම පුද්ගලයෙකුම සතුව අඩු-වැඩි වශයෙන් පවතින මෙම බල ගුරුවරයා විසින් සංවර්ධනය කරගත යුතුය. ශ්‍රද්ධා බලය යනු ශ්‍රද්ධාව නිසා ඇතිවන බලය යි. එය යම් කරුණක් සම්බන්ධයෙන් ඇදහීම් ලක්ෂණ කොට එහි නොසැලී සිටීමේ හැකියාව සහිත චෛතසික බලයකි. වීර්ය බලය යනු නොසැලී සිටීමට හේතුවන ශක්තියකි. පුද්ගලයා අලස කමින් පසුබට කළ නොහැකි ලෙස දියුණු කළ ශක්තියක් ලෙස වීර්යය දැක්විය හැකිය. ස්මෘති බලය යනු මනා ලෙස සිහිය පිහුටුවා ගැනීමෙන් ලැබෙන ශක්තිය යි. ස්මෘතියෙන් ලබාගන්නා බලය යි. සිහිය නිරවුල් නිසා ඇතිවන ශක්තිය යි. සමාධි බලය යනු උද්දච්චයෙන් මැඩලීමට නොහැකි ලෙස දියුණු කළ සමාධිය යි. සිත ඒකාග්‍රතාවයකට පමුණුවා ගැනීමෙන් ඇතිවන ශක්තිය යි. කම්පා නොවී සිටීමට හේතුවන චිත්ත ඒකාග්‍රතාවය යි. ප්‍රඥා බලය යනු මෝහයෙන් හෙවත් මුලාවෙන් නොසෙල්විය හැකි ප්‍රඥාවේ බලය යි. අවිද්‍යාවට මර්දනය කළ නොහැකි ප්‍රමාණයට දියුණුවූ ප්‍රඥාව යි. මෙම බල පඤ්චකය ගුරුවරයා හෝ උපාධ්‍යායවරයා සංවර්ධනය කර ගැනීම ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලිය සංවර්ධනය සඳහා ඉවහල් වන්නකි. ඒ අනුව සිසුවාගේ පඤ්චවිධ බලය අඩු-වැඩි ලෙස සංවර්ධනය වේ.

මීට අමතරව ගුරුවරයෙකු සතු ගුණාංග අටක් පිළිබඳව අංගුත්තර නිකායේ අට්ඨක නිපාතයේ දැක්වේ.

''ඉධ භික්ඛවෙ භික්ඛු සොතා ච හොති සාවෙතා ච, උග්ගහෙතා ච ධාරෙතා ච, විඤ්ඤාතා ච විඤ්ඤාපෙතා ච, කුසලො ච සහිතාසහිතස්ස, නො ච කලහකාරකො. ඉමෙහි බො භික්ඛවෙ, අට්ඨහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු දූතෙය්‍යං ගන්තුමරහති.'' (බු.ජ.ත්‍රි.පි.ග්‍ර.මා. අං.නි. අටඨක නිපාත, දූතෙය්‍ය සූත්‍රය:78).

01. සවන් දෙන්නෙකු විය යුතු ය. - (සොතා)

02. සවන්දීම කෙරෙහි අසන්නාගේ අවධානය කැඳවන්නෙකු විය යුතු ය. - (සාවෙතා)

03. ඉගෙනගන්නෙකු විය යුතු ය. - (උග්ගහෙතා)

04. අසන්නාහට මතකයේ තබා ගැනීමට සහායවන්නකු විය යුතු ය. - (ධාරෙතා)

05. කරුණු කාරණා දන්නෙකු විය යුතු ය. - (විඤ්ඤාතා)

06. විස්තර විභාග දක්වන්නෙකු විය යුතු ය. - (විඤ්ඤාපෙතා)

07. උචිතානුචිත දේ පිළිබඳව කුසලතාව සහිත විය යුතු ය. - (කුසලො සහිතාසහිතස්ස)

08. කලහකාරී නොවිය යුතු ය. - (න ච කලහකාරී)

ගුරුවරයාගේ පෞරුෂ සංවර්ධනය මෙන්ම ගුරු කාර්ය සාර්ථකත්වය සඳහා මෙම ගුණාංග ඉවහල් කරගත හැකිය. එය සිසුවාගේ ඉගෙනුම් ශෛලිය ධනාත්මකව සංවර්ධනය වීමට හේතුවන්නකි. සෝතා යනු ගුරුවරයා හොඳ සවන් දෙන්නෙකු විය යුතුය. ශිෂ්‍ය ඉගෙනුම් ශෛලිය සකස්වීමේදී ගුරු කාර්ය සාර්ථකත්වයට ඔහු ශිෂ්‍යයාට හොඳ සවන්දෙන්නෙකු විය යුතුය. සවන්දීම ලෙස කියවීම, ඇසීම, නැරඹීම ආදියෙන් ප්‍රකාශ වන අදහස්

අවබෝධ කරගෙන ඒ අනුව ක්‍රියා කිරීම අදහස් කරයි. ගුරුවරයා සිසුවාට ඇහුම්කම් දීම සිසුවාගේ හැඟීම්, දැනීම්, හැකියා, රුචි-අරුචි කම්, ශක්තීන් හා දුර්වලතා අවබෝධ කරගැනීමට ද ඉවහල් වේ. එමෙන්ම ගුරුවරයා සවන්දීම කෙරෙහි අසන්නාගේ අවධානය කැඳවන්නෙකු විය යුතු ය. මෙහිදී සිසුවා ඇහුම්කම් දෙන්නාගේ අවධානය ග්‍රහණය කරගැනීමට ගුරුවරයා සමත් විය යුතුය. ඇසීමට හා කියවීමට සිසුවාගේ අවධානය යොමු කරවීමට සමත්වීම සාර්ථක ගුරුවරයෙකුගේ ලක්ෂණයකි. එය අවධානය ලබා ගැනීම ලෙස ද දැක්විය හැකිය. එමෙන්ම ගුරුවරයා ඉගෙනගන්නෙකු ද විය යුතුය. නූතන සමාජයේ දැනුම නිරන්තරයෙන් ප්‍රසාරණය වන හෙයින් ඔහු සිසුන් පිළිබඳව, විෂය අන්තර්ගතය පිළිබඳව, නව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම පිළිබඳව, නව මනෝවිද්‍යාත්මක, දාර්ශනික හා සමාජ විද්‍යාත්මක සොයාගැනීම් සම්බන්ධව මෙන්ම නව තාක්ෂණය සම්බන්ධයෙන් ද නිරන්තර අවදියෙන් සිට ඉගෙනගන්නෙකු විය යුතුය. එවිට සිසුවා ද නිතර විමසිල්ලෙන් යුතුව නව දැනුම ග්‍රහණය කරගැනීමට පෙළඹේ. ගුරුවරයා අනාගත පරම්පරාවේ නිර්මාපකයා වන බැවින් දිවි ඇති තුරු ඉගෙනගත යුතුය. ගුරුවරයා අසන්නාට උගන්වන දෙය ධාරණය කර ගැනීමට සහාය විය යුතුය. ඒ සඳහා යම් යම් ඉගෙනුම් හා ඉගැන්වීම් උපක්‍රම පිළිබඳ දැනුවත් භාවයකින් ඒවා යොදාගත යුතුය. ගුරුවරයා විෂය අන්තර්ගතය, ඉගැන්වීම හා ශිෂ්‍යයා සම්බන්ධව මනා දැනුමැත්තෙක් විය යුතුය. එය ශිෂ්‍ය ඉගෙනුම් ශෛලිය සකස්වීම සඳහා ඉවහල් වේ.

එමෙන්ම ගුරුවරයා විස්තර විභාග දක්වන්නෙකු විය යුතුය. මනාව විෂය කරුණු අවබෝධ කරගත්තේනම් උගත් දෙය පිළිබඳ විස්තර විභාග කිරීමට හැකියාව පැවතිය යුතුය. ගුරුවරයා විස්තර විභාග කිරීම පිළිබඳව අදක්ෂයෙකු නම් ශිෂ්‍යයා විෂය කරුණු අවබෝධ කරගැනීමේ අදක්ෂයෙකු වේ. එය ශිෂ්‍යයා පීඩාවට පත්කරයි. එසේ හෙයින් ගුරුවරයා මනාව විස්තර විභාග දක්වන්නෙකු විය යුතුය. ගුරුවරයා උචිතානුචිත දේ පිළිබඳ ව අවබෝධකර ගැනීමේ කුසලතාව ද සහිත විය යුතු ය. සාවද්‍ය හා නිරවද්‍ය විෂය කරුණු වටහා ගැනීමේ කුසලතාවය සංකල්ප සාධනයේදී අත්‍යාවශ්‍යය. එය ඉගෙනුම් ශෛලියෙහි ලක්ෂණයකි. එමෙන්ම ගුරුවරයා කලහකාරී නොවිය යුතු ය. කායික හා මානසික සංවරය මෙන්ම චිත්තවේගික

සංවරය ද ගුරුවරයාට පැවතිය යුතුය. මෙම ගුණාංග අට ගුරුවරයෙකු සතුව පවතී නම් ගුරුවරයාගේ ගුරු කාර්ය සාර්ථක වේ. සාර්ථක ගුරුවරයා අනුව කටයුතු කරන ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලිය ද වඩා ක්‍රමවත්ව සකස් වේ.

මෙලොව සිටින ගුරුවරුන් අතුරින් ශ්‍රේෂ්ඨතම ගුරුවරයා ලෙස ගෞතම සම්බුදුරජාණන් වහන්සේ අවිවාදයෙන් පිළිගනියි. තිලෝගුරු යන ගෞරවණීය වචනයෙන් ද බුදුන්වන්සේ හඳුන්වයි. එනම් තුන් ලොවටම ගුරුවරයා යන අදහසයි. පස් දෙනෙකුගෙන් ඇරඹි ශිෂ්‍ය පිරිස ක්‍රමක්‍රමයෙන් සිවුවනක් පිරිස ලෙස සංවර්ධනය වෙමින් බුදුන්වහන්සේ පිරිනිවන්පාන අවස්ථාවේ මුලුමහත් ඉන්දියාව පුරාම දසදහස් ගණනින් ව්‍යාප්තවූයේ බුදුන්වහන්සේගේ අසහාය ගුරු පෞරුෂය හේතුවෙනි. ජීවිතයේ පීඩාකාරී විවිධ අත්දැකීම් අනුව යන එන මග පිළිබඳව අවබෝධයෙන් තොරව මංමුලාවී ජීවිතමදයෙන් මත්ව සිටි පිරිසට මෙන්ම ජීවිතයේ යථාර්ථය සොයමින් ගමන් කළ පුද්ගලයන්ට බුදුන්වහන්සේ නිසි මගපෙන්වීම් සිදු කළහ. සිවුවනක් පිරිසට රජවරුන්, සිටුවරුන්, මහාමාත්‍යවරුන්, වෙළෙන්දන්, ගොවියන්, කම්කරුවන්, කසලශෝධකයන්, තීර්ථකයන් මෙන්ම රජ බිසෝවරුන්, රාජ කුමාරිකාවන්, සිටුවරියන්, ගණිකාවන්, කුලවත් කාන්තාවන්, නුකුලවත් කාන්තාවන්, මෙහෙකාරියන්, මනෝව්‍යාධිවලින් පෙළෙන්නන් ආදී සමාජයේ සිටින සියලු තරාතිරම්වල පුද්ගලයන් හා කාන්තාවන් ඇතුළත් විය. ඔවුන් සියලු දෙනාගේම පුද්ගල ස්වභාවය අනුව විෂය කරුණු ග්‍රහණය කරගැනීම, අවබෝධ කරගැනීම ආශ්‍රයෙන් සකස්වූ ඉගෙනුම් ශෛලියට යෝග්‍ය ලෙස අවවාද හා අනුශාසනා කළ අසහාය ගුරුවරයා බුදුරජාණන් වහන්සේ විය. මෙසේ පුද්ගල අවබෝධය ඔස්සේ නිවීම සඳහා මග පෙන්වන බුදුන් වහන්සේ සතුව ප්‍රාතිහාර්ය හෙවත් විස්මය ඇති කරවන හැකියා තුනක් විය. එය කේවඩ්ඪ සූත්‍රයේ මෙසේ දක්වා ඇත.

''තීණි ඛො ඉමානි කෙවඩ්ඪ පාටිහාරියානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි. කතමානි තීණි? ඉද්ධිපාටිහාරියං, ආදෙසනාපාටිහාරියං, අනුසාසනීපාටිහාරියන්ති.'' (බු.ජ.ත්‍රි.පි.ග්‍ර.මා. දී.නි. කේවඩ්ඪ සූත්‍රයඃ 486,). ඒ අනුව

01. ඉද්ධිපාටිහාරිය - ඍද්ධි ලබයෙන් කරනු ලබන විවිධ ප්‍රාතිහාර්යයය

02. ආදෙසනාපාටිහාරිය - පරසිත් ගැන කීමට ඇති හැකියාව

03. අනුසාසනීපාටිහාරිය - අනුශාසනා කිරීම හෙවත් දහම් දෙසීමේ ප්‍රාතිහාර්යය

මෙම ප්‍රාතිහාර අතුරෙන් ඉද්ධි ප්‍රාතිහාර්ය හා ආදෙසනා ප්‍රාතිහාර්ය වඩා අනුසාසනා ප්‍රාතිහාර්යයය අනුව බුදුන් වහන්සේ ප්‍රාතිහාර්යයය දක්වමින් දෙවි මිනිසුන්ගේ අවබෝධය සඳහා ඉගැන්වීම් සිදුකළහ. ඇතැම් අවස්ථාවල ඍද්ධි ප්‍රාතිහාර්ය හා ආදෙසනා ප්‍රාතිහාර්ය ද ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලිය අනුව යොදාගන්නා ලදි. මෙම ප්‍රාතිහාර්යන් ත්‍රිත්වයම ඒ ඒ ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලියේ ස්වභාවය අනුව අඩු වැඩි වශයෙන් ගුරුවරයා විසින් යොදාගත යුතු බව පැහැදිලිය. එවිට ගුරුවරයාගේ ස්වභාවය අනුව ශිෂ්‍යයා ස්වකීය ඉගෙනුම් ශෛලිය ගොඩනගා ගැනීම සිදුකරයි.

බුදුන්වහන්සේගේ අසහාය ගුරු භූමිකාව නිරූපණය කළ අවස්ථාවක් අභිධර්ම පිටකයේ සඳහන්ය. එහිදී ගුරුවරයාගේ ස්වභාවය අනුව ශිෂ්‍ය ඉගෙනුම් ශෛලියට සකස්වන ආකාරය විස්තර කරයි.

"අභිඤ්ඤායාහං භික්ඛවෙ ධම්මං දෙසෙමි නො අනභිඤ්ඤාය. සනිදානාහං භික්ඛවෙ ධම්මං දෙසෙමි නො අනිදානං. සප්පටිහාරියං. තස්ස මය්හං භික්ඛවෙ අභිඤ්ඤාය ධම්මං දෙසයතො නො අනභිඤ්ඤාය, සනිදානං ධම්මං දෙසයතො නො අනිදානං, සප්පටිහාරියං ධම්මං දෙසයතො නො අප්පටිහාරියං, කරණීයො ඔවාදො, කරණීයා අනුසාසනී, අලඤ්ච පන වො භික්ඛවෙ තුට්ඨියා, අලං අත්තමනතාය, අලං සොමනස්සාය, (බු.ජ.ත්‍රි.පි.ග්‍ර.මා. අ.පි.,කථාවත්ථුප්පකරණය:328).

බුදුන්වහන්සේ ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලිය අනුව (අභිඤ්ඤාය) පූර්ණාවබෝධය පිණිස, (සනිධානං) සහේතුකව, (සප්පාටිහාරියං) අර්ථාන්විතව, (ඔවදති) අවවාද කරමින් (අනුසාසති) උගන්වමින්, අනුශාසනා කරමින් (දෙසෙති) දේශනා කරමින් අනුග

ාමිකයන්ගේ අවබෝධය පුළුල් කළහ. මෙය ඒ ඒ සිසුවාගේ ඉගෙනුම් ශෛලිය අනුව ගුරුවරයා සිය භූමිකාව සකස්කර ගැනීමක් ලෙස ද දැක්විය හැකිය.

ගුරුවරයෙකු සංකල්ප සාධනය වන අයුරින් ක්‍රමානුකූලව ඉගැන්වීමේදී කටයුතු කළ යුතු ආකාරය සච්චවිභංග සූත්‍රයේ පැහැදිලි කරයි. ඒ අනුව යම් විෂය කරුණක් ඉගැන්වීමේදී විශාල පිරිසක් සිටින්නේ නම් ඔවුන් සියලු දෙනාටම විෂය කරුණ මනාව වැටහෙන පරිදි ක්‍රමානුකූලව පැහැදිලි කළ යුතුය. එය වත්මන් පංතිකාමරයේ සිටින සමස්ත සිසුන්ට යම් විෂය කරුණක් අවබෝධ කරවීම හා සමානය. ඒ ඒ අවස්ථාවේ ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලිය අනුව ක්‍රමානුකූලව ගැඹුරුවන අයුරුන් ගුරුවරයාගේ ඉගැන්වීමේ ස්වභාවය සිදුවන ආකාරය එකිනෙකට සමාන වචන කිහිපයකින් දක්වා ඇත.

"ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං" ( බු.ජ.ත්‍රි.පි.ග්‍ර.මා. ම.නි. සච්චවිභංග සූත්‍රය).

ආචික්ඛති - (දන්වයි)

දෙසෙති - (දේශනා කරයි, කියා දෙයි)

පඤ්ඤාපෙති - (නියම කරයි, පණවයි)

පට්ඨාපෙති - (පිහිටුවයි)

විවරති - (විස්තර කරයි)

විභජති - (කරුණු බෙදමින් විස්තර කරයි)

උත්තානි කරොති - (අර්ථය ප්‍රකට කරයි)

මෙසේ ක්‍රමානුකූලව ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලියට ගැලපෙන අයුරින් අවබෝධය කරා ගමන් කරන ලෙස විෂය අන්තර්ගතය ඉදිරිපත් කිරීමේ හැකියාව ගුරුවරයාට පැවතිය යුතුය. ඇතැම් ගුරුවරු ඉහත සඳහන් ආකාරවලින් කිහිපයක් හෝ එකක් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී භාවිත කරයි. ඇතමෙක් එම

ක්‍රියාවලි සියල්ල ඒ ආකාරයෙන්ම භාවිත කරයි. ඒ අනුව ගුරුවරයාගේ ස්වභාවය අනුව විෂය අන්තර්ගතය ග්‍රහණය කර ගැනීම, වටහා ගැනීම, සැකසීම, ගබඩා කිරීම හා සිහිපත් කිරීම මත පදනම්ව ශිෂ්‍ය ඉගෙනුම් ශෛලිය සකස්කර ගනු ඇත.

ගුරුවරයා විෂය අන්තර්ගතය ඉදිරිපත් කිරීමේදී ක්‍රමානුකූලව සරලත්වයේ සිට සංකීර්ණත්වය දක්වා සංවර්ධනය විය යුතුය. අලෝභය, අද්වේශය, අමෝහය යන කුසල් සිතුවිලි සංවර්ධනය වන ලෙසත් රාගය, ද්වේෂය, මෝහය, ක්‍රෝධය, වෛරය, ගුණමකු බව, අනුන්ගේ ගුණ හා තමන්ගේ ගුණ සමාන කිරීම, අනුන්ගේ යහපත නොයිවසීම, තමන් සතුදේ වෙනත් අයෙකු සතුවීම නොයිවසීම, නැති දෙයක් ඇති සේ පෙන්වීම, කපටි බව, සිතේ තද ගතිය, එකටෙක කිරීම, උඩගු බව, අධික මානය, මත් බව ආදී අයහපත් චිත්තවේග මැඩ පවත්වන ලෙසත් අයහපත් සිතුවිලි ප්‍රහාණය වන ලෙසත් මග පෙන්විය යුතුය. එහිදී ගුරුවරයාගේ ස්වභාවය අනුව ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලිය සකස්වනු ඇත. ඒ අනුව

''රාගස්ස භික්ඛවෙ පරිඤ්ඤාය (ඡ ධමමා භාවෙතබ්බා -පෙ- රාගස්ස භික්ඛවෙ) පරික්ඛයාය -පෙ- පහානාය -පෙ- ඛයාය -පෙ- වයාය -පෙ- විරාගාය -පෙ- නිරොධාය -පෙ- චාගාය -පෙ- පටිනිස්සග්ගාය ඉමෙ ඡ ධම්මා භාවෙතබ්බා'ති '' (බු.ජ.ත්‍රි.පි.ග්‍ර.මා. අං.නි. ඡක්කනිපාතය, රාගාදිපෙය්‍යාල සූත්‍රය:272-274).

| | | |
|---|---|---|
| පරිඤ්ඤාය | - | සම්පූර්ණයෙන් අවබෝධය සඳහා |
| පරික්ඛයාය | - | විනාශය සඳහා |
| පහානාය | - | දුරු කිරම සඳහා |
| ඛයාය | - | ගෙවීයාම සඳහා |
| වයාය | - | වියදම සඳහා |
| විරාගාය | - | නො ඇලීම සඳහා |
| නිරොධාය | - | නැවැත්ම සඳහා |

චාගාය - පරිත්‍යාගය සඳහා

පටිනිස්සග්ගාය - අත්හැරීම සඳහා

ගුරුවරයා සිසුවාට මග පෙන්විය යුතු ය. මෙහිදී කායික, මානසික හා චිත්වේගීය වශයෙන් සිසුවා හික්මීම ගුරුවරයාගේ ස්වභාවය අනුව සිදුවෙයි. මෙහිදී ගුරුවරයා ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලිය අනුව විෂය අන්තර්ගතය හා ඉගැන්වීමේ ක්‍රම යොදා ගැනීම වැදගත්ය. ඇතැම්විට ගුරුවරයා යොදාගන්නා විෂය අන්තර්ගතය හා ඉගැන්වීම් ක්‍රමවේද ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලියට නොගැලපුනහොත් ඉගෙනුම අසාර්ථක වනු ඇත. සුවණ්ණකාරක තෙරුන්ගේ කතාවේදී සැරියුත් හිමි විසින් ලබාදුන් කමටහන් සිසුවාගේ ඉගෙනුම් ශෛලියට නොගැලපීමෙන් සිවු මසක් ගතවී ද කිසිදු සාධනයක් ලබාගත නොහැකි විය (බු.ජ.ත්‍රි.පි.ග්‍ර.මා. ඛු.නි. ධම්මපදට්ඨ කථා 2, 2008:306-308,). අනතුරුව බුදුන් වහන්සේ විසින් ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලියට යෝග්‍ය කමටහනක් හෙවත් විෂය අන්තර්ගතයක් ලබාදීමෙන් සුවණ්ණකාරක තෙරුන් එක් වරුවකින් අවබෝධයට පත් කිරීමට හැකි විය. මේ අනුව ගුරුවරයාගේ ස්වභාවය අනුව ශිෂ්‍යයාගේ ඉගෙනුම් ශෛලිය සකස්වන බව පැහැදිලිය.

**නිගමනය**

ඉගෙනුම් ශෛලිය යනු ශිෂ්‍යයා තොරතුරු රැස් කිරීම, සංවිධානය කිරීම හා තොරතුරු අර්ථාන්විත දැනුමක් බවට පත්කිරීම ආශ්‍රිත ඉගෙනුම් ක්‍රමෝපායන් අනුගමනය කරමින් යමක් සංජානනය කිරීම මගින් ස්වකීය ඉගෙනුම කළමනාකරණය කිරීමකි. උපාධ්‍යාය හා ආචාර්ය වශයෙන් ගුරුවරයාගේ භූමිකාව නිරූපණය කරන භූමිකා දෙකක් විනය පිටකයෙහි සඳහන් අතර ඔවුන්ගේ ක්‍රියාකලාපය අනුව අන්තේවාසික හා සද්ධිවිහාරික වශයෙන් ශිෂ්‍යයාගේ භූමිකා දෙකක් ද පවතී. මෙහිදී උපාධ්‍යායවරයා ආධ්‍යාත්මික සාධනයේදී සිසුවාට සමීප ගුරුවරයා බව පැහැදිලිය. ශිෂ්‍යයා ව්‍යක්ත හා ප්‍රතිබල සහිත වන තුරු උපාධ්‍යාය සමීපයෙහි ගතකළ යුතු අතර ව්‍යක්ත හා ප්‍රතිබල රහිත ශිෂ්‍යයා දිවි ඇතිතුරු උපාධ්‍යාය ඇසුරේ විසිය යුතුය. ව්‍යක්ත හා ප්‍රතිබලතාවය සඳහා සංවර්ධනය කරගත යුතු පංච බලයකි. එනම් ශ්‍රද්ධා බලය, වීර්ය බලය, ස්මෘති බලය, සමාධි බලය, ප්‍රඥා බලය යි.

එමෙන්ම ගුරුවරයා සතු ගුණ අටකි ඔහු සවන් දෙන්නෙකු විය යුතු ය, සවන්දීම කෙරෙහි අසන්නාගේ අවධානය කැඳවන්නෙකු විය යුතු ය, ඉගෙනගන්නෙකු විය යුතු ය, අසන්නාහට මතකයේ තබා ගැනීමට සහාය වන්නකු විය යුතු ය, කරුණු කාරණා දන්නෙකු විය යුතු ය, විස්තර විභාග දක්වන්නෙකු විය යුතු ය, උචිතානුචිත දේ පිළිබඳව කුසලතාව සහිත විය යුතු ය, කලහකාරී නොවිය යුතු ය. බුදුන්වහන්සේ සතුව ප්‍රාතිහාර්ය ත්‍රිත්වයක් ද විය. ගුරුවරයා ද මෙම ප්‍රාතිහාර්ය උපදවාගත යුතුය. එනම් ඉද්ධිපාටිහාරිය, ආදේසනාපාටිහාරිය හා අනුසාසනීපාටිහාරිය යි. එය සිසුවාගේ ඉගෙනුම් ශෛලිය පහසු කරන්නකි. ශිෂ්‍ය ඉගෙනුම් ශෛලියේ ස්වභාවය අනුව ක්‍රමානුකූලව ගැඹුරුවන අයුරුන් ඉගැන්වීම සිදුකළ යුතුය. එහිදී මූලිකවම විෂය කරුණු දන්වා, අනතුරුව කියාදිය යුතුය, අනතුරුව පැණවිය යුතුය. ඉන්පසු පිහිටුවාලිය යුතු අතර පසුව විස්තර කරදිය යුතුය. විස්තර කරදීමෙන් අනතුරුව කරුණු බෙදා දක්වමින් විස්තර කළ යුතු අතර අවසානයේ අර්ථය ප්‍රකට කළ යුතුය. සිසුවාගේ අයහපත් චිත්තවේග හා සිතුවිලි ප්‍රහාණය කිරීම සඳහා ඔහුගේ ඉගෙනුම් ශෛලියට අනුව මග පෙන්වීමේදී එය සම්පූර්ණයෙන් අවබෝධය සඳහා විය යුතුය. අයහපත් චර්යා හා ආකල්ප විනාශය සඳහා විය යුතුය. දුරු කිරම සඳහා විය යුතුය, ගෙවීයාම සඳහා විය යුතුය, වියදම සඳහා විය යුතුය, නො ඇලීම සඳහා විය යුතුය, නැවැත්ම සඳහා විය යුතුය, පරිත්‍යාගය සඳහා විය යුතුය, අත්හැරීම සඳහා විය යුතුය. මේ අනුව ඉගෙනගන්නා තමා ඉගෙනගන්නට උත්සාහ කරන දේ වඩාත් ඵලදායී ලෙස වටහාගැනීම, සැකසීම, ගබඩා කිරීම හා සිහිපත් කිරීම ආශ්‍රයෙන් සකස්වූ ශිෂ්‍ය ඉගෙනුම් ශෛලිය ගුරුවරයාගේ ස්වභාවය අනුව සකස්වන බව බුදුසමය පැහැදිලි කරයි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අභිධර්ම පිටකය, කථාවත්ථුප්පකරණයඃ (Retrieved July 25, 2021 from https://tipitaka.lk/ap-kvu-18-2/75-2/pali).

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අංගුත්තර නිකාය iii" m[apl ksmd;" (Retrieved July 25, 2021 from

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අංගුත්තර නිකාය iv" ඡක්කනිපාතය" (Retrieved July 25, 2021 from https://tipitaka.lk/an-6-3-3/60-14/pali&)'

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අංගුත්තර නිකාය v, අට්ඨක නිපාත, (Retrieved July 25, 2021 from https://tipitaka.lk/an-8-1-2-6/38-6/pali).

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය i, ධම්මපද පාළි, (Retrieved July 25, 2021 from https://tipitaka.lk/kn-dhp-20/35-0/pali).

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය vi, මණ්ඩපෙය්‍ය කථා (Retrieved July 25, 2021 from https://tipitaka.lk/kn-ps-1-10/9-3/pali).

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, දීඝ නිකාය i, කේවඩ්ඪ සූත්‍රය (Retrieved July 25, 2021 from https://tipitaka.lk/dn-1-11/1-0/pali).

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, මජ්ඣිම නිකාය iii, "සච්චවිභංග සූත්‍රය" (Retrieved July 25, 2021 from https://tipitaka.lk/mn-3-4-11/57-3/pali).

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, මජ්ඣිම නිකාය iii, "උපරිපණ්ණාසකය" (Retrieved July 25, 2021 from https://tipitaka.lk/mn-3-1-7/47-0/sinh).

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, විනය පිටකය iii, "මහාවග්ග පාළි'' (Retrieved July 25, 2021 from https://tipitaka.lk/vp-mv-1/52-0/p).

අථර්වන් වේදය -11-5-14

ආරියදාස සෙනෙවිරත්න, නාගොඩ (සංස්) (2001), මනුස්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඤාණිස්සර හිමි, පාතේගම (2007) බුදුසමය සහ අධ්‍යාපන විද්‍යාව. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

චන්දවිමල හිමි, රේරුකානේ (2008) උපසම්පදා ශීලය. පොකුණුවිට: ශ්‍රී චන්දවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය,

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (2014) පාළි-සිංහල අකාරාදිය, කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

විජයතුංග, හරිස්චන්ද්‍ර, (2011) ගුණසේකර සිංහල ශබ්දකෝෂය, කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

සිරි ලියනගේ, (2010) බෞද්ධ ශබ්දකොෂය, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සුමේධ හිමි, පත්නල, (2008) ධම්මපදට්ඨ කථා 2 (සිංහල පරිවර්තන), නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සුමනසිරි හිමි, දෙණිපිටියේ, (1967) සිගාලෝවාද සූත්‍ර වර්ණනාව හෙවත් යුතුකම, කොළඹ: ඇම.ඩී. ගුණසේන සහ සමාගම.

සුමංගල හිමි, අම්බලන්ගොඩ, (සංස්) 2005, සමන්තපාසාදිකා විනයට්ඨකථා-සිංහල පරිවර්තනය, කොළඹ: ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය.

සුමංගල හිමි, අම්බලංගොඩ (සංස්) (2005) සමන්තපාසාදිකා විනයට්ඨකථා-සිංහල පරිවර්තනය, කොළඹ: ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය.

සෝරත හිමි, වැලිවිටියේ, (1952) ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, කොළඹ: මහාබෝධි මුද්‍රණාලය.

ශ්‍රී ධර්මවංශ හිමි, මාතර (1957) සිංහල විශුද්ධි මාර්ගය , මාතර: සීමාසහිත මාතර වෙළෙන්දෝ.

Abdul Gafoor. K. & Haskar Babu U. (2012) Teaching Style: A Conceptual Overview. Teacher Education In The New Millennium, New Delhi, Retrieved June 17, 2020, from https://www.researchgate.net/publication.

James, W. B. & Gardner, D. L. (1995). Learning Styles: Implications for Distance Learning. (New Directions for Adult and Continuing Education no. 67,1995) 20p. Retrieved June 17, 2020, from https://onlinelibrary.wiley.com.

Reid, J.M.(1995) Learning Styles in the ESL/EFL Classroom. (Boston: Heinle & Heinle Publishers, 1995) 32p' Retrieved June 17, 2020, from https://eric.ed.gov) Retrieved June 12, 2018 from http: // www. psychology discussion .net /learning.

Wichuda, J., Chaisiri, A., Manoch, C. Athavudh, D. & Juntima, E. (2015) Learning styles and academic achievement among undergraduate medical students in Thailand.(Journal of Education for Health Profession. 2015). . Retrieved July 4, 2016 from http://www.nebi.nlm.nih.gov.

Zhang, L., Sternberg, R.J. & Fan, J. 2013. Revisiting the concept of ‘style match’. British Journal of Educational Psychology, 83(2):225–237. Retrieved February, 06, 2021, from https://www.researchgate.